ජනාධිපති කාර්යාලය
ஜனாதிபதி அலுவலகம்
PRESIDENTIAL SECRETARIAT

මගේ අංකය: PS/SB/Misc.(2022)/01

2022 දෙසැම්බර් මස 23 දින

ගරු විනිසුරු ජගත් බාලපටබැඳි මහතා
සභාපති
රාජ්‍ය සේවා කොමිෂන් සභාව

ප්‍රිය මහත්මයාණෙනි

**<u>දිප ව්‍යාප්ත සේවාවන්වල I ශ්‍රේණියේ නිලධාරීන් තනතුරු සඳහා පත්කිරීම</u>**

රජයේ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල විධායක සේවා ගණයේ I ශ්‍රේණියේ තනතුරු සඳහා දිප ව්‍යාප්ත සේවාවල නිලධාරීන් තෝරා ගැනීමට නව ක්‍රමවේදයක් හඳුන්වා දීමට පියවර ගනිමින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2022 සැප්තැම්බර් මස 15 දින නිකුත් කොට ඇති අංක 02/2022 දරන චක්‍රලේඛය සම්බන්ධවයි.

02. දිවයිනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 330 න් 162 කම ප්‍රාදේශීය ලේකම්වරුන් දැනට වැඩ බැලීමේ පදනමින් පත් කොට ඇති අතර අනෙකුත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල ද සැළකිය යුතු නිලධාරීන් සංඛ්‍යාවක් වැඩ බැලීමේ පදනම මත සේවය කරමින් සිටිති. මෙම සියලුම නිලධාරීන්ගේ පත්වීම් 2022.12.31 දිනෙන් අවසන් වුවහොත් රජය විසින් සපයනු ලබන මහජන සේවාවන් අඩාල වී දැඩි අර්බුදකාරී තත්ත්වයක් නිර්මාණය වීමේ ඉඩකඩක් පවතී. තව ද, පවතින ආර්ථික අර්බුදකාරී තත්ත්වය යටතේ රජයේ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල පුරප්පාඩු වන සෑම තනතුරක් සඳහාම මෙම ක්‍රමවේදය අනුගමනය කිරීමට සිදුවීම තුළින් රාජ්‍ය සේවාවන් කාර්යක්ෂමව පවත්වාගෙන යාමට බාධා මතු වනු ඇත.

03. එසේම, රජයේ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල මෙන්ම දිස්ත්‍රික් හා ප්‍රාදේශීය පරිපාලනයේ විධායක ගණයේ I ශ්‍රේණියේ තනතුරක පුරප්පාඩුවක් ඇති වූ අවස්ථාවක අයදුම්පත් කැඳවා සම්මුඛ පරීක්ෂණ මණ්ඩල සඳහා අනුමැතිය ලබා ගෙන අදාළ සම්මුඛ පරීක්ෂණ පවත්වා එහි නිර්දේශ රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු කිරීමෙන් අනතුරුව අදාළ පත්වීම් සිදුකිරීමට ප්‍රායෝගිකව ඉතා දීර්ඝ කාලසීමාවක් ගත වන බව නිරීක්ෂණය කරන අතර, වාර්ෂික ස්ථානමාරු පටිපාටිවලට හා සුහද මාරු සඳහා මෙම චක්‍රලේඛය අදාළ නොවන බැවින් එකම තනතුර සඳහා විවිධ ක්‍රමවේද හරහා පත්වීමට හැකියාව ලැබීම හේතුවෙන් විෂමතා හටගැනීමක් ද නිරීක්ෂණය කරමි. තව ද, පළාත් සභාවලට අනුයුක්ත දිප ව්‍යාප්ත සේවාවන්වල නිලධාරීන්ට මෙම ක්‍රමය අදාළ නොවීම හේතුවෙන් මධ්‍යම රජයේ සේවය කරනු ලබන දිප ව්‍යාප්ත සේවාවන්වල නිලධාරීන් හා පළාත් සභාවලට අනුයුක්ත දිප ව්‍යාප්ත සේවාවන්වල නිලධාරීන් තනතුරුවලට පත් කිරීමේ ක්‍රමවේදවල විෂමතාවයක් ද නිර්මාණය විය හැකිය.

04. ඒ අනුව, අදාළ පාර්ශවයන්ගේ අදහස් හා යෝජනා ලබා ගනිමින් මනා අධ්‍යයනයක් සිදුකොට විධිමත් ක්‍රමවේදයක් ස්ථාපිත කරන තෙක් දැනට නිකුත් කොට ඇති අංක 02/2022 දරන රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛය වහාම ක්‍රියාත්මක වන පරිදි අත්හිටුවීමට සළකා බැලීම පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අවධානය යොමු කරවනු කැමැත්තෙමි.

ස්තූතියි
මෙයට - විශ්වාසී

ඊ එම් එස් බී ඒකනායක
ජනාධිපති ලේකම්
දුරකථන: + 94 11 2354422 ෆැක්ස්: + 94 11 2446657
විද්‍යුත් තැපැල: prsec@presidentsoffice.lk

පිටපත: ලේකම්, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය - කරු. අ.ක.ස



CamScanner